# කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

## தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சு

## Ministry of Labor and Foreign Employment

හයවන මහල, "මෙහෙවර පියස", නාරාහේන්පිට, කොළඹ 05, ශ්‍රී ලංකාව.
6 ஆவது தளம், "மெஹெவர பியெச", நாரஹேன்பிட்டி, கொழும்பு 05, இலங்கை.
6th Floor, " Mehewara Piyesa", Narahenpita, Colombo 05, Sri Lanka.


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. : MOL/POL/01/2022 | ඔබේ අංකය / உமது இல / Your No. : | දිනය / திகதி / Date : 2023.03.21 |

**කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 02/ 2022 (iii)**

**එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයන්හට පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීමට බලපත්‍ර ලබාදීමේ යෝජනා ක්‍රමය**

පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීම සඳහා එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයින්හට බලපත්‍ර ලබාදීමේ උක්ත යෝජනා ක්‍රමයට අදාළව කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය විසින් නිකුත් කරනු ලැබූ, අංක 02/2022 (i) (2022.09.09) හා 02/ 2022 (ii) (2022.09.16) න් සංශෝධිත 2022.08.31 දිනැති අංක 02/2022 චක්‍රලේඛයට වැඩිමනත් වශයෙනි.

**2. මේ සම්බන්ධයෙන් 2023 ජනවාරි 16 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී ගනු ලැබූ තීරණයකට අනුව,යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු අදාල වේ.**

2.1 වාහන බලපත්‍රයක් ලබාදීමට අදාළව ප්‍රේෂණ සලකා බැලූ කාල සීමාවේ අවසන් දිනය දක්වා එනම්, 2022.05.01 දින සිට 2022.12.31 දින දක්වා මෙරටට විදේශ මුදල් ප්‍රේෂණය කරනු ලැබ ඇති විගමණික ශ්‍රමිකයින් විසින් ආනයනය කරනු ලබන විද්‍යුත් මෝටර් රථ සඳහා සුබෝපභෝගී බද්ද තීරණය කිරීමට අදාල මිල, රක්ෂණ, ගැල් කුලී වටිනාකමේ (CIF) සීමාව ඇමෙරිකානු ඩොලර් 40,000 (ආසන්න වශයෙන් රුපියල් මිලියන 12) වේ.

2.2 ආනයනය කරනු ලබන වාහනය හුදෙක් විගමණික ශ්‍රමිකයාගේ පෞද්ගලික පරිහරණය සඳහා ම පමණක් විය යුතු අතර, මීට අදාළ ණයවර ලිපිය 2023 ජුනි 30 දිනට පෙර විවෘත විය යුතු අතර, එම වාහනය 2023 සැප්තැම්බර් 30 දින හෝ එදිනට පෙර ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කළ යුතුය.

2.3 කෙසේ වෙතත් නිදර්ශනය කිරීම/ ප්‍රදර්ශනය කිරීම සඳහා පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කරනු ලබන නියෝජිතයින්/ බලයලත් බෙදාහරින්නන්හට මෙම බදු සහනය හිමි නොවේ.

2.4 වාහනය තෙවන පාර්ශවයකට පැවරීමට අදාළ කොන්දේසි ඇතුළත් 2022.08.31 දිනැති චක්‍රලේඛ අංක 02/2022 හි 4.3 වගන්තිය අවසානයට 2022.09.09 දිනැති සංශෝධිත චක්‍රලේඛ අංක 02/2022 (i) මගින්, එකතු කරනු ලැබූ <u>පහත සඳහන් යෙදුම ඉවත් කෙරේ</u>.

> "කෙසේ වෙතත්, ලියාපදිංචියෙන් වසර 2ක් ඉක්මවා යාමට පෙර වාහනය තෙවන පාර්ශවයකට පවරනුයේ නම් එහිදී පැවරීමේ බදු ලෙස වාහනයේ CIF වටිනාකමෙන් 10% ක් අදාළ වන අතර එය ඇමෙරිකානු ඩොලර් වලින් ගෙවීමට කටයුතු කළ යුතු ය".

2.5 ඒ අනුව අංක 02/2022 මුල් චක්‍රලේඛයේ 4.3 වගන්තිය ඉහත යෙදුම රහිතව මුලින් පැවති පරිදිම පහත සඳහන් ආකාරයට බල පැවැත්වේ.

"මෙම යෝජනා ක්‍රමය 4.4 වගුවෙහි දැක්වෙන කාලසීමාව ඉක්මවා ක්‍රියාත්මක වන අවස්ථාවකදී එතෙර රැකියාවක නිරත ශ්‍රී ලාංකිකයකුට එක් බලපත්‍රයක් නිකුත් කළ දින සිට සෑම වසර 5කට වරක් වාහනයක් ආනයනය කිරීමට හිමිකම් ලැබෙන අතර, ලියාපදිංචියෙන් වසර 2කට පසුව වාහනය තෙවන පාර්ශවයකට පැවරීමට ද අවසර ලැබේ

3. මේ සම්බන්ධයෙන් ඔබට කිසියම් පැහැදිලි කරගැනීමක් අවශ්‍ය වන්නේ නම්, දුරකතන අංක 0112582447 ඔස්සේ ලබාගත හැකිය.

ආර්.පී.ජ්. විමලවීර
ලේකම්

ආර් පී ඒ විමලවීර
ලේකම්
කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය
7 වන මහල, "මෙහෙවර පියෙස"
නාරාහේන්පිට, කොළඹ 05.

ලේකම්/செயலாளர்/Secretary : −94 112 368164 කාර්යාලය/அலுவலகம்/Office : +94 112 581991 ෆැක්ස්/தொலைநகல்/Fax : +94 112 582938/+94 112 368165
විද්‍යුත් තැපැල/மின்னஞ்சல்/E-mail : slmol@slt.lk / slmol @labourmin.gov.lk වෙබ් අඩවිය/இணையத் தளம்/Web site: www.labourmin.gov.lk